# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2295/09 - 2022 අගෝස්තු මස 31 වැනි බදාදා - 2022.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී. 10/2011

**2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත**

2 වැනි වගන්තිය යටතේ වූ නියමය

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 2 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මෙම නියමය මගින්,

(*අ*) 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනතේ 2 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මගින් අධිකාරියලත් කැසිනෝවකට අදාළව එකී බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි කැසිනෝ ව්‍යාපාරය කරගෙන යනු ලබන ස්ථානය හෝ පරිශ්‍රය, කැසිනෝ ව්‍යාපාරයේ නිරතවීම සඳහා නිශ්චිත ප්‍රදේශය විය යුතු බවට නම් කරනු ලබන අතර ;

(*ආ*) මෙම නියමය 2022 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබේ.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

EOG 09-0145



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*